# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,999 - 2016 දෙසැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 3050 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 3055 |


*සැ. යු.* -(i) පාලිත තෙවරප්පෙරුම පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 දෙසැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) තාක්ෂණ සහ සමාජ සේවා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 දෙසැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) පොළොන්නරුව බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 දෙසැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජනවාරි මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 දෙසැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ක්වාසි මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් බඳවා ගැනීම සඳහා මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පිරිමියෙකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීයමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට (අධිකරණ නිලධරයෙකු හැර) මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරුවන් වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහයක් විය යුතු ය.

මෙම මණ්ඩලයේ සභාපතිවරයාට මසකට රුපියල් 15,000 ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 3,750 ක් බැගින් මසකට රුපියල් 15,000 ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක්ද, සාමාජිකයකුට මසකට රුපියල් 12,000 ක දීමනාවක් සහ එක් රැස්වීමකට රුපියල් 2,000 ක් බැගින් මසකට රුපියල් 8,000 ක උපරිමයට යටත්ව ගමන් වියදම් දීමනාවක්ද, ගෙවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි මණ්ඩලය" යනුවෙන් සඳහන් කර 2017 ජනවාරි මස 22 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමඟ ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,<br>
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2016 දෙසැම්බර් මස 06 වැනි දින,<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,<br>
තැ. පෙ. 573,<br>
කොළඹ 12.

***1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ ක්වාසි මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් පත් කිරීමේ ආදර්ශ අයදුම්පත***

දිස්ත්‍රික්කය :

1. මුලකුරු සමඟ නම :

උදා. අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උදා. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකතන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

1. ……………………………………………………………………
2. ……………………………………………………………………
3. ……………………………………………………………………
4. ……………………………………………………………………
5. ……………………………………………………………………

12. වෘත්තීය සුදුසුකම් :

1. ……………………………………………………………………
2. ……………………………………………………………………
3. ……………………………………………………………………
4. ……………………………………………………………………
5. ……………………………………………………………………

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : ඔව් නැත

15. විවාහක ද ? : ඔව් නැත

16. ඔබ නීතිඥවරයෙක් ද? : ඔව් නැත

17. නීතිඥවරයෙකු නම් බඳවා ගන්නා ලද දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

18. ඉහත දී කරන ලද සහ දැනට කරන රැකියා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

19. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම : රු.

20. මාසික ආදායම : රු.

21. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

22. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද : ඔව් නැත

23. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද : ඔව් නැත

24. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : ඔව් නැත

25. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

26. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

______________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :____________.

*සටහන* :

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

12-1024

## නිවැරදි කිරීමයි

### රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2016.12.09 වැනි දින පළවූ අංක 1997 දරන *ගැසට් පත්‍රයේ,* රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහු ඛණ්ඩ 1 (MN-2-2006A) සේවා ගණය - වෙබ් ලේඛක (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) තනතුර සඳහා බඳවා ගැනීම යටතේ පළවූ නිවේදනයේ ආදර්ශ අයදුම් පත්‍රය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද,

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2016 දෙසැම්බර් මස 15 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත,
කොළඹ 05.

### ආදර්ශ අයදුම් පත්‍රය

☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි)

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බහු ඛණ්ඩ 1 (MN-02-2006- A) සේවා ගණය අයත් වෙබ් ලේඛක තනතුර සඳහා බඳවා ගැනීම**

1.0 මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2 ☐
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු :
2.1 මුල'කුරු අගට යොද මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
උදහරණ : SILVA A. B.
2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.5 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐
ස්ත්‍රී - 1

2.6 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐
විවාහක - 2

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) ☐
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.8 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.9 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

2.10 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු. ☐☐ මාස ☐☐ දින ☐☐

2.11 දුරකථන අංකය (තිබේ නම්) : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 අධ්‍යාපන සුදුසුකම් ඃ අ. පො. ස. (සා. පෙළ) විභාගය ඃ වර්ෂය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ.පෙළ.) විභාගය ඃ වර්ෂය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

4.0 වෘත්තිය සුදුසුකම් :————.

5.0 අයදුම්කරුගේ සහතිකය ඃ

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6.0 අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන...................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් .......................... දින මා ඉදිරියේදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 22,935 ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

12-1144

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016

(කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)

අංක 1930/12 හා 2015.09.01 දිනැති රජයේ අති විශේෂ *ගැසට් නිවේදනය* මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් 2017 මැයි මස සිට සතිඅන්ත පාඨමාලාවක් ලෙස සති 15 ක් පුරා සෙනසුරාදා දිනයන්හි පැවැත්වීම ආරම්භ කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, පාඨමාලාව අවසානයේදී එකිනෙක විෂයය සඳහා අවසන් පරීක්ෂණයක් පැවැත්වේ. එහි ප්‍රතිඵල මත පාඨමාලාව සමත්වීම තීරණය කරනු ලබන අතර, සමත් වූ අයදුම්කරුවන් ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළා සේ සැළකේ. පාඨමාලාවට නිලධරයන් තෝරා ගැනීම, පාඨමාලාව පැවැත්වීම, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම, පාඨමාලා සහතික නිකුත් කිරීම හා සහන කාල ලබාදීම සම්බන්ධයෙන් එම පීඨයේ පීඨාධිපති විසින් නියම කරන ලද නීති රීතිවලට පාඨමාලා අපේක්ෂකයින් යටත් වේ. විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීති රීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන දඬුවමකට හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වීමට ඔවුනට සිදුවෙනු ඇත.

(ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීතිරීති, හා පාඨමාලාව සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පාඨමාලාව ආරම්භයේ දී ඔබව දැනුවත් කරනු ඇත.

03. මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මධ්‍යම රජයේ නිලධරයෙකු නම්, තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම්, ඔවුන් සේවය කරන පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2017 ජනවාරි මස 31 වැනි දින නොඉක්මවා, ''පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ'' යන ලිපිනය වෙත තම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016'' (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව) ලෙස සඳහන් විය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පරීක්ෂණයකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට පීඨාධිපති වෙත බලය පිරිනමනු ලැබේ.

04. *අනන්‍යතාවය* :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පාඨමාලා ආරම්භයේදී හා පාඨමාලා කාලය තුළ අවශ්‍යතාවය මත ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් විසින් ළඟ තබා ගත යුතුය.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය;

(*ආ*) තම ආයතනය විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය;

*හෝ*

තම ආයතනය විසින් නිකුත් කරන ලද අනන්‍යතාවය තහවුරු කළ හැකි ලේඛනයක්.

05. *අයදුම්පත්‍රය* :

(i) ''ඒ 4'' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් පිරවිය යුතු අතර, විශේෂයෙන්ම සඳහන් කර ඇති අවස්ථාවලදී පමණක් විශේෂයෙන් සඳහන් කර ඇති භාෂාවෙන් අයදුම්පත පිරිවිය යුතුය. අයදුම්පතේ සඳහන් පරිදි නිලධරයන්ගේ නම පාඨමාලාවේ සියළු අවස්ථාවලදී භාවිතා කරන බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය. යම් හෙයකින් එම තොරතුරු පාඨමාලා කාලය තුළ වෙනස් වුවහොත් ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ලිඛිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා වෙත දැනුම් දිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රය පිළියෙල කරන ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්කරු විසින් අයදුම්පතේ මුල්පිටේ දකුණත් පස ඉහළ කෙළවරේ සපයා ඇති කොටුව තුළ තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායාරූපයක් ඇලවිය යුතුවන අතර, තවත් තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායාරූපයක් අයදුම්පත සමඟ අමුණා තිබිය යුතු ය.

06. *පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු :*

(i) මෙම පාඨමාලාව සඳහා පෙනී සිටින නිලධරයන් විසින් රු. 17,500.00 ක මුදලක් මහජන බැංකුව ගංගොඩවිල ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨ සංවර්ධන අරමුදල් ජංගම ගිණුම් අංක 097100140002229 නමට සේවා නියුක්ත ආයතනය මගින් එවනු ලබන චෙක්පතකින් හෝ බැංකු අණකරයකින්, අදාළ අයදුම්කරු විසින් මුදල් තැන්පත් කර, ලබාගත් රිසිට්පත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා වෙත පාඨමාලාව සමාරම්භක දිනයට සතියකට පෙර ඉදිරිපත් කළ යුතු ය. මෙම මුදල සඳහා ආයතනික ගාස්තු, මුද්‍රණ ගාස්තු, විභාග ගාස්තු, සම්පත්දායක දීමනා සම්බන්ධීකරණ ගාස්තු ඇතුළත් වේ.

(ii) එසේ වුවත් මුල් අවස්ථාවේ දී පාඨමාලාවට අදාළ විභාග සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස රු. 1,000 ක ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටීම සඳහා රු. 2000 ක ගාස්තුවක් ද, ගෙවිය යුතු ය. එම ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපතිගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

(iii) කවර හේතුවක් යටතේ වුව ද මෙම පාඨමාලාව සඳහා අයකරන කිසිදු ගාස්තුවක් ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් හෝ පාඨමාලාවක් හෝ නිලධරයකු සඳහා මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

07. *පාඨමාලාව හැදෑරීමේ අවශ්‍යතාවය :*

(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගතවීමට පෙර සියලු නිලධරයන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ii) 2013.06.01 දිනය වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

*සටහන.*-දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ ඒ නිලධරයාගේ ජ්‍යෙෂ්ඨතාවය හා ඉහත 07. i, 07. ii ඡේදවල කරුණු සම්බන්ධයෙන් තම අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

08. *පාඨමාලාව සඳහා තෝරාගැනීම :*

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වූ නිලධරයන්ගේ එම ශ්‍රේණියට පත්වූ ජ්‍යෙෂ්ඨතාවය අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දේ.

09. අයදුම්පත් එවා ඇති සියලුම නිලධරයන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර වරකට 200 කණ්ඩායම් 2 බැගින් වසරකට 800 දෙනෙකු මෙම පාඨමාලාවට සහභාගී කරවා ගනු ලබයි. පාඨමාලාව සඳහා සහභාගීවීමට තෝරාගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනයක් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තෝරාගනු ලබන නිලධරයන් වෙත ඒ බව දන්වනු ලබයි. පාඨමාලාව සඳහා ප්‍රමාණවත් පිරිසක් නොමැති අවස්ථාවක දී පමණක් නැවත *ගැසට් නිවේදනයක්* මගින් මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.

10. *පාඨමාලාවේ විෂය නිර්දේශය :*

| *අනු. අංකය* | *විෂය නිර්දේශය* | *ක්‍රෙඩිට් ගණන* | *ක්‍රෙඩිට් පැය* |
|---|---|---|---|
| 01 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 02 | 30 |
| 02 | මානව සම්පත් කළමනාකරණය (මූලික සිද්ධාන්ත) | 02 | 30 |
| 03 | ගැටුම් කළමනාකරණය (සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේ දී ගැටුම් කළමනාකරණ සිද්ධාන්තවල ප්‍රායෝගික භාවිතය) | 02 | 30 |
| 04 | සංවිධාන චර්යාව | 02 | 30 |
| 05 | ව්‍යාපෘති වාර්තාව තමන්ගේ වෘත්තීය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මතු වන ගැටළුවක් හෝ වෘත්තීය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණාත්මක නිබන්ධනයක් | 02 | 30 |
| | | **10** | **150** |

11. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2016 දෙසැම්බර් මස 08 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(*ගැසට් නිවේදනය* හා ආදර්ශ අයදුම්පත්‍රය www.pubad.gov.lk වෙතින් බාගත කරගත හැක.)

### ආදර්ශ අයදුම්පත්‍රය

| තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් මෙතැන අලවන්න. |
|---|

| |
|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

*ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)*

01. (*අ*) මුල'කුරු අගට යොද මුල'කුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා* : GUNAWARDHANA M. G. B. S. K.

(*ආ*) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(*ඇ*) මුල'කුරු සමඟ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවය ට ද යන වග :
අදාල අංකය කොටුව තුල ලියන්න. [ ]

(මධ්‍යම රජයේ රාජ්‍ය සේවය -10/බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/ දකුණු පළාත් රාජ්‍ය සේවය - 03/ උතුරු පළාත් රාජ්‍ය සේවය - 04/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 05 / වයඹ පළාත් රාජ්‍ය සේවය-06/ උතුරුමැද පළාත් රාජ්‍ය සේවය -07/ඌව පළාත් රාජ්‍ය සේවය - 08/සබරගමුව පළාත් රාජ්‍ය සේවය - 09)

03. තනතුරු නාමය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. ඔබ අයත්වන උප දෙපාර්තමේන්තුව/අංශය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

05. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

06. රාජකාරී ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

07. පෞද්ගලික ලිපිනය :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(සිංහලෙන්/දෙමළෙන්) :————.

08. විද්‍යුත් තැපැල :————.

09. දුරකථන අංකය :

පෞද්ගලික : [ | | | | | | | | | ]

රාජකාරී : [ | | | | | | | | | ]

10. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - M
ස්ත්‍රී - F [ ]
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

11. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කල ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණන්න.)

12. (i) උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

(ii) I ශ්‍රේණියට උසස් වූ දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

(iii) 2017.01.31 දිනට I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය :

අවු. : [ | ] මාස : [ | ] දින : [ | ]

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ 1 ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

(iv) 2013.06.01 දිනට I ශ්‍රේණියේ සේවා කාලය :

අවු. : [ | ] මාස : [ | ] දින : [ | ]

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, තවද පාඨමාලාව පැවැත්වීම, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති විසින් පනවනු ලබන නීතිරීති වලට හා ආයතන සංග්‍රහයේ නීතිරීති වලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

.........................................................,
අයදුම්කරු/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................................ මහතා/මහත්මිය/මෙනෙවිය ............... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

.............................................,
අත්සන සහතික කරන
නිලධරයාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අංක 01 සිට 12 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් 07 ඡේදයේ සටහනට අනුව මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම පාඨමාලාවට සහභාගිවීමට සුදුසුකම් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයකු බවත්, නියමිත පාඨමාලා ගාස්තු ගෙවීමට දෙපාර්තමේන්තුවට හැකියාව පවතින බවත් සහතික කරමි.

.......................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිලමුද්‍රාව.

දිනය :——————.

**පිරික්සුම :**

1. තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණා ඇත. ☐
2. මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත ඉහළ දකුණත් කෙළවරේ අලවා ඇත. ☐
3. මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත සමග අමුණා ඇත. ☐
4. I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ලිපිය අමුණා ඇත. ☐

12-1010

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට

*2017 වසරේ පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම*

**පූර්ණ කාලීන පාඨමාලා**

| No. | Course | NVQ Level | Duration (Months) | Qualifications |
|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D |
| 3 | Computer Graphic Designer | IV | 6 | D |
| 4 | Adobe ACA - Graphic Designer | IV | 6 | D |

**අර්ධ කාලීන පාඨමාලා**

| Course | Duration (Hours) | Qualifications | Course Fee (Rs.) |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 12,000.00 |
| CCNA Routing & Switching | 300 | D | 40,000.00 |
| PC Based Application Assistant (MS Office) | 100 | I | 9,500.00 |

| No. | Course | NVQ Level | Duration (Months) | Qualifications |
|---|---|---|---|---|
| 5 | NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | Q |
| 6 | NVQ - V in ICT with ORACAL Academy Certification Training | V | 12 | M |
| 7 | Computer Graphic Designer (Hearing Impaired) | IV | 6 | – |
| 8 | Draftperson | IV | 12 | N |
| 9 | Quantity Surveying | V | 12 | O |
| 10 | Baker | IV | 6 | A |
| 11 | Cook | IV | 6 | A |
| 12 | Waiter/Steward | III | 6 | I |
| 13 | Automobile A/C Mechanic | IV | 6 | A |
| 14 | Beautician | IV | 6 | B |
| 15 | Hair Dresser | IV | 6 | B |
| 16 | Cosmatelogy | V | 12 | F |
| 17 | Diploma in Industrial Management | Non | 6 | E |
| 18 | Electrician | IV | 12 | A |
| 19 | Offset Lithographic Operator | IV | 6 | I |
| 20 | Machinist (CNC Milling) | IV | 6 | C |
| 21 | Machinist | IV | 12 | A |
| 22 | Driver - Light Vehicle | Non | 3 | G |
| 23 | Pre School Teacher | IV | 12 | J |
| 24 | Automobile Painter | III | 6 | B |
| 25 | Aluminium Fabricator | IV | 6 | I |

| Course | Duration (Hours) | Qualifications | Course Fee (Rs.) |
|---|---|---|---|
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 22,500.00 |
| ICT Technician (NVQ IV) | 350 | A | 20,000.00 |
| IC3 + International Certificate* | 120 | K | 10,000.00 |
| Developing Web Application using Joomla | 150 | K | 5,000.00 |
| Photographer | 150 | P | 40,000.00 |
| Auto Cad ( 2D) * | 80 | L | 7,500.00 |
| Auto Cad ( 3D) * | 80 | L | 8,000.00 |
| Baker | 100 | B | 14,000.00 |
| Cook | 100 | B | 14,000.00 |
| Cut & Style hair (Ladies) | 100 | B | 10,250.00 |
| Facials & skin care Treatment | 100 | B | 10,500.00 |
| Make up & Bridle Dressing | 80 | B | 11,000.00 |
| Auto Mobile Technician (Engine/ Petrol/ Diesel) | 160 | B | 10,500.00 |
| Draughtsmanship (Building Drawing) | 150 | D | 13,500.00 |
| CNC Programming | 125 | A | 9,000.00 |
| Electrical Wiring Industrial | 120 | A | 14,500.00 |
| Electrical Wring Domestic | 120 | A | 13,000.00 |
| Motor Control System | 100 | A | 13,000.00 |
| Automobile A/C Mechanic * | 125 | B | 13,000.00 |
| Driver (Light Vehicle) | 105 | G | 13,500.00 |
| Pre School Teacher | 120 | A | 15,000.00 |

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2016.12.31 වැනි දිනට වයස අවු. 16ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාද/ඉරිදා දිනයන්හි හා *සන්ධ්‍යා කාලීනව ද පැවැත් වේ.

ප්‍රතිලාභ :

* සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා ගාස්තු නිදහස් කර ඇත.

* දේශීය විදේශීය රැකියා අවස්ථා.

* කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්.

* ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක් විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2017.01.03 වැනි දිනට පෙර පහත ලිපිනයට එවන්න.

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකතනය : 011-2592233
011-7277111 (IT Centre)
ඊ-මේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112-553856, 011-2592233

සුදුසුකම්

A. අ.පො.ස. (සා.පෙළ) විෂයන් 06 කින් සමත් වීම.

B. 9 වසර සමත් වීම.

C. ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2 L3 සහතික ලබා තිබීම.

D. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.

E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/වැඩ මූලික සහායක/වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.

F. රූපලාවන්‍ය හෝ කොණ්ඩා සැකසුම් ශිල්පී NVQ Level III / IV ලබා තිබීම.

G. 9 වසර සමත්වීම සහ අවුරුදු 18 ට වැඩිවීම.

H. අ.පො.ස. (සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06 කින් සමත්වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

I. අ.පො.ස. (සා.පෙළ) පෙනී සිටීම.

J. අ.පො.ස. (උ/පෙළ) විෂයන් 02කින් සමත් වී තිබීම.

K. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයන් 06 කින් සමත් වී තිබීම.

L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.

M. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්වීම හෝ NVQ Level III / IV මට්ටම සමත් වීම.

N. අ.පො.ස. (උ/පෙළ) විෂයන් 3 කින් සමත් වී තිබීම.

O. අ.පො.ස. (උ/පෙළ) කලා / වානිජ විෂය ධාරාවන් හැර විෂයන් 03 කින් සමත්වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් පාඨමාලාවක් හදාරා තිබීම සමඟ අ.පො.ස. (උ/පෙළ) විභාගයට පෙනී සිටීම.

P. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

Q. අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි ගණිතය සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.

12-1040

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.01.23 වේ. සියලුම අයදුම්පත් එදිනට ප්‍රථම ''දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, මරදාන කොළඹ 10'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කිසිම අයදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතු ය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය.

01. *අයදුම්පත් කැඳවනු ලබන තනතුර* :

දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණිය

02. *තනතුරේ රාජකාරි ස්වභාවය* :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු/දුම්රිය එන්ජින් රියදුරු (ෂන්ටින්) ගේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ දුම්රිය ධාවනය යන කාර්යය සඳහා දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුර වෙත පවරා ඇති රාජකාරි ලැයිස්තුවට අනුව රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි.

03. *වැටුප් පරිමාණය* : MT-1-2006 (ඒ)

රු. 14,425 - 10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - රු. 23,665 (රා.ප.ච 03/2016 අනුව වැටුප පරිවර්තනය කරනු ලැබේ.)

04. (අ) *අධ්‍යාපන සුදුසුකම්* :

(i) (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

(*ආ*) *වෘත්තීය සුදුසුකම්* :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර 2 1/2 ක කාර්මික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

(*ඇ*) කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(ii) උස අවම වශයෙන් අඩි 05 අඟල් 04 ක් විය යුතු ය.

(iii) 6'6', 6'6' දෘෂ්ඨි පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(*ඈ*) *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ඉහත (04) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා එම ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ලබන අතර, එහිදී බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා කායික යෝග්‍යතාවය තිබේද යන්න පරීක්ෂා කර අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ. මෙහිදී පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු කරනු නොලැබේ.

06. *බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පරිපාටිය* :

(i) *විභාග ක්‍රමය* :

(*අ*) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.

(*ආ*) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ii) *විභාගයේ විෂයයන්* :

කාර්මික දැනුම - කාලය පැය 02 යි. ලකුණු 100 යි
සමත් ලකුණු සංඛ්‍යාව - ලකුණු 50 යි

(iii) *විෂය නිර්දේශය* :

දුම්රිය රියදුරු සහායක තනතුරෙහි කාර්යභාරයට සමාන්තර වන සේ යන්ත්‍රෝපකරණ හා ඒවායේ භාවිතයන් පිළිබඳව සරල දැනුම පරීක්ෂා කෙරේ.

07. *අයදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස්* :

(i) අයදුම්පත A4 (යතුරු ලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙළ කළ යුතු ය.

(අයදුම්පත තම අත්අකුරින් සම්පූර්ණ කළ යුතු යි.)

ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 500 කි. එය දුම්රිය සාමාන්‍යාධිකාරීගේ ගිණුම් අංක 176-100129027-313 දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ගෙවා අදාල ලදුපත ඉල්ලුම් පත්‍රයේ නොගැලවෙන සේ ඇමිණිය යුතුය. මෙම ලදුපත ඉදිරිපත් නොකිරීම හෝ වෙනයම් ආකාරයට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද, විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016, ලෙස සඳහන් කරන්න.

(iv) බාහිර අයැදුම්කරුවන් අයැදුම්පත්වල අත්සන සහතික කිරීම.

''රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු - රු. 240,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.''

(v) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. මොවුන්ගේ අයැදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයැදුම්කරුවන්ට තරග විභාග යට පෙනී සිටීමට විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම හෝ විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

(vii) ''විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(viii) අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ජාතික හැඳුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි.

(ix) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

08. *සේවා කොන්දේසි* :

දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණියට බඳවා ගනු ලබන මෙම නිලධාරීන් බඳවා ගනු ලබන දින සිට මාස නවයක (09) පුහුණු කාලයකට යටත් කර දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුරෙහි රාජකාරීවලට අදාළව ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවක් ලබා දෙනු ලැබේ.

09. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තවදුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ මට්ටමේ ප්‍රවීනතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ක ආනුෂාංගික චක්‍රලේඛ අනුව ලබාගත යුතු යි.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පිරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝගයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

10.(i) මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් දුම්රිය එන්ජින් රියදුරු සහායක අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සියලුම විධිවිධාන අදාළ වන බව දැනුම් දෙමි.

(ii) මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරී සතු වේ.

(iii) මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සළකා කටයුතු කළ යුතු ය.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

**ආදර්ශ අයැදුම්පත්‍රය**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

Open Competitive Examination For Recruitment to The Post of Railway Engine Driver Assistant Grade - III of Sri Lanka Railway Department - 2016

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය :

සිංහල - 2
දෙමළ - 3 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. සම්පූර්ණ නම :

(i) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(*උදා.*: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) සිංහලෙන්/දෙමළෙන් :—————.

02. අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :

i. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(*උදා.* : GUNAWARDHANA, H. M. S. K.)

ii. සිංහලෙන්/දෙමළෙන් :—————.

03. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

04. ස්ථිර ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් :—————.
ii. ඉංග්‍රීසියෙන් :—————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජන වර්ගය :

සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/
ඉන්දියා ද්‍රවිඩ - 3 / මුස්ලිම් - 4/
බර්ගර් -5/මැලේ - 6 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. පදිංචිය :

i. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————. එහි අංකය [ ]

ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.

iii. දිස්ත්‍රික්කය :—————.

08. උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

2017.01.23 දිනට වයස :

අවු. : [ | ] මාස : [ | ] දින : [ | ]

09. අධ්‍යාපන සුදුසුකම් :

i. අ.පො.ස. (සා. පෙළ)

*විභාග අංකය* :—————. *වර්ෂය* :—————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| i. | | |
| ii. | | |
| iii. | | |
| iv. | | |
| v. | | |
| vi. | | |
| vii. | | |
| viii. | | |
| ix. | | |

ii. වෘත්තීය සුදුසුකම් :—————.

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :—————.

11. අයැදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයැදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවරුදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) ..................දින .............................මහජන බැංකු ශාඛාවට රු. 500 ක් ගෙවා ලබාගත් ලදුපත මේ සමග අමුණා ඇත.

...............................................
අයැදුම්කරුගේ අත්සන.

දිනය :——————.

12. අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................මහතා මම පුද්ගලිකව හඳුනමි. ඔහු .......................... දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

——————.
සහතික කරන අයගේ අත්සන

දිනය :——————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කර ඇති................................................ මහතා ........................................................ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................දින සිට ...................... දින දක්වා .............................. වශයෙන් සේවය කරන අතර, ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායක ය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු සහායක III ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

..........................................
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

12-858

---

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර හා සත්ත්ව ඒකක පාලක (වැටලීම්) තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - 2016

01. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් පාලනය වන නාරාහේන්පිට පිහිටි මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය ආයතනයේ ''පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර'' තනතුරේ පවතින පුරප්පාඩු 09 ක් හා '' සත්ත්ව ඒකක පාලක (වැටලීම්)'' තනතුරේ පවතින පුරප්පාඩු 04ක් විවෘත පදනම මත පිරවීම සඳහා සුදුසුකම්ලත් පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් :*

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව සිටීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

03. *පළපුරුද්ද :*

(අ) *පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර* - රජයේ හෝ රජයේ අනුබද්ධ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක එක් අවුරුද්දකට නොඅඩු කාලයට එන්නත් කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

(ආ) *සත්ත්ව ඒකක පාලක (වැටලීම්)* - වසරකට නොඅඩු කාලයක් ප්‍රජා නායකත්වය දැරූ බවට හෝ ශිෂ්‍ය භටයෙකු ලෙස කටයුතු කර ඇති බවට සහතිකයක් ලබා තිබීම.

04. *වෘත්තීය සුදුසුකම්* :

(අ) පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර - අදාළ නොවේ.

(ආ) සත්ත්ව ඒකක පාලක (වැටලීම්) - සුනඛයින් පාලනය කිරීමේ කටයුතු වල වසරක පළපුරුද්දක් ඇති බවට රජයේ හෝ රජයේ අනුබද්ධ හෝ රජයේ පුද්ගලික ආයතනයකින් සහතිකයක් ලබා තිබීම.

05. *අනෙකුත් පොදු සුදුසුකම්* :

(අ) 2017. 01. 23 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි පිරිමි අයදුම්කරුවන් විය යුතු ය.

(ආ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ඇ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඉ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඊ) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

06. *අයදුම්කළ යුතු ක්‍රමය* :-

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඒ - 4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් මුල් පිටුවට අංක 1.0 සිට 5.1 දක්වාත්, දෙවන පිටුව 5.2 සිට 8.0 දක්වාත්, ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත්අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(ආ) තනතුරු දෙකම සඳහා අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍රයේ පැහැදිලිව අදල ස්ථානයේ තනතුරු දෙක සඳහා මනාපය ලකුණු කළ යුතු යි.

(ඇ) අයදුම්පතෙහි ''ලදුපත'' යන ස්ථානයේ, ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට රු. 500/- බැර කර එම ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයේ අදල ස්ථානයේ ඇලවිය යුතුය. ( ලදුපත ඇලවීමට ප්‍රථම එහි පිටපතක් තබා ගන්න.)

(ඈ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයකු / හෝ ත්‍රිවිධ හමුදවේ අධිකාරි බලයලත් නිළධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 334,452 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කල යුතු ය.

(ඉ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ ''.................. තනතුරට බඳවා ගැනීම 2016'' යනුවෙන් සඳහන් කර 2017. 01. 23 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 03, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ''සුවසිරිපාය'', අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ - 10 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

07. දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිළධාරීන් මේ සඳහා අයදුම් කරන්නේ නම් එම නිළධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය.

08. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් කොන්දේසි වලට හා ආදර්ශ අයදුම්පත්‍රයට අදල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාවය සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් අනතුරුව ඉහත සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව III වන ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ.

තෝරා ගන්නා අයදුම්කරුවන්ට පමණක් ලිපියකින් දැනුම් දෙන අතර ප්‍රතිඵල ලැයිස්තුව www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලැබේ.

10. ලිඛිත විභාගය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ. :-

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| I. සාමාන්‍ය දැනීම | අදාළ ක්ෂේත්‍රය ඇසුරින් තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | පැය 02 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| II. බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

සෑම අතින්ම නිවැරදි අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ :-

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
3. වලංගු රියදුරු බලපත්‍රය,

12. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

(*අ*) ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(*ආ*) මෙම තනතුරට පත්වන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(*ඇ*) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාල ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

(*ඈ*) වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

(*ඉ*) තෝරාගනු ලබන අයදුම්කරුවන් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ - 02 සේවා ගණයේ බඳවා ගැනීමේ පටිපාටියට හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පටිපාටික රීති, හා රජය විසින් නිකුත් කරනු ලබන නියෝග හා රෙගුලාසි වලටද යටත් විය යුතු ය.

13. තනතුරු වලට පත් කරනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව පශුඑන්නත් ක්ෂේත්‍ර සහකාර හා සත්ව ඒකක පාලක (වැටලීම්) තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය, පෝෂණය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පවතින පුරප්පාඩු මත එම තනතුරේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට කටයුතු කෙරේ. පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර හා සත්ව ඒකක පාලක (වැටලීම්) තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN- 01 - 2016 වැටුප් පරිමාණය රු: 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660- රු. 45,540 හිමිවන අතර වැටුප් ගෙවීම එම චක්‍රලේඛයේ උපලේඛන II ට අනුව සිදු කරනු ලැබේ.

14. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති, අසම්පූර්ණ ලෙස තොරතුරු සටහන් කර ඇති, හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථානගතවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කල යුතුය. පත්වීම් ලැබීමෙන් පසු සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම් අවලංගු කර තනතුරෙන් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ / ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

16. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය සෞඛ්‍ය, පෝෂණ හා

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය සෞඛ්‍ය ලේකම් සතුය.

17. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය
වෛද්‍ය අමාත්‍යාංශය.

2016 නොවැම්බර් මස 17 වැනි දින,
''සුවසිරිපාය'',
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

## ආදර්ශ අයදුම්පත්‍රය

සෞඛ්‍ය, පෝෂණය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය ආයතනයේ පවතින කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ - 2 [MN - 01 - 2006 (ඒ)] සේවා ගණයට අයත් ''පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර'' හා සත්ව ඒකක පාලක (වැටලීම්)'' III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම - 2016

විභාගයට පෙනී සිටින,

භාෂා මාධ්‍ය :- සිංහල - 1,
දෙමළ - 2,
ඉංග්‍රීසි - 3, ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විභාගය සඳහා ඉල්ලුම් කරන තනතුර සහ මනාපය :

| *තනතුර* | *මනාපය* |
|---|---|
| පශු එන්නත් ක්ෂේත්‍ර සහකාර | |
| සත්ව ඒකක පාලක (වැටලීම්) | |

01. (a) අයදුම්කරුගේ මුල්'කුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා* :- SILVA A. D.

Mr. / Mrs. / Miss :—————.

(b) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(c) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :—————.

02. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) :—————.

(iii) පදිංචි දිස්ත්‍රික්කය :—————. (iv) දුරකථන අංකය :—————.

(v) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

03. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(i) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද යන වග : ඔව් : ☐ නැත : ☐ (අදල කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)

05. අධ්‍යාපන සුදුසුකම් : (අදළ සහතික ඇමිණිය යුතු ය. )

(i) අ. පො. ස (සා.පෙළ) විභාගය : විභාග අංකය :——————. වර්ෂය :——————.

| | විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |
| 05 | | | | |
| 06 | | | | |

(ii) අ. පො. ස (උ.පෙළ) විභාගය : විභාග අංකය :——————. වර්ෂය :——————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

(iii) පළපුරුද්ද :- ඇත : ☐ නැත : ☐ (අදල කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)

අදළ විස්තර සඳහන් කරන්න. (සහතික මගින් සනාථ කළ යුතු ය.) :——————.

(iv) වෘත්තීය සුදුසුකම් : (සත්ත්ව ඒකක පාලක වැටලීම් තනතුරට අදළව) : ඇත : ☐ නැත : ☐

(අදළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න) :——————.

අදළ විස්තර සඳහන් කරන්න. (සහතික මගින් සනාථ කළ යුතු ය.) :——————.

06. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? : ඔව් : ☐ නැත : ☐

(අදළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.) :——————.

ඔව් නම් විස්තර සපයන්න. :——————.

07. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් මෙම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහ කරනු ලබන බවද, පිළිගනිමි.

| |
|---|
| මුදල් ගෙවන ලද ලදුපත මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ළඟ තබාගන්න. |

දිනය :——————.

..................................................
අයදුම්කරුගේ අත්සන.

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .........................................................මයා / මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........................................ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

........................................................
සහතික කරන්නාගේ අත්සන.

දිනය :——————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිලමුද්‍රාව තබා සනාථ කළ යුතු යි.)

12-903

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.